කොවිඩ්-19 සම්බන්ධයෙන් වන මාධ්‍ය වාර්තාකරණයෙන් හිදී ආසාදිතයින් සමාජය තුළ කොන් කිරීමකට ලක් නොකරන, ඔවුන් සම්බන්ධයෙන් ගර්හාත්මක ආකල්පයක් ඇති නොකරන භාෂා භාවිතයක් වැදගත් වන බව අප විසින් යළි යළිත් පෙන්වා දී ඇත. නමුත් තවමත් ඇතැම් මාධ්‍ය තුළ එවැනි ගර්හාත්මක, කොන් කරන සුළු යෙදුම් භාවිතා වේ.

මෙයට උදාහරණයක් ලෙස ලංකාදීප සහ දිනමිණ පුවත් සිරස්තලයන් තුළ සඳහන් වන "කොරෝනා සිරකරුවන්" සහ "කොවිඩ් මවුවරුන්" වැනි යෙදුම් දැක්විය හැක.

සිරස්තලයක් සඳහා හැකි අවම වචන ප්‍රමාණයක් යොදාගැනීම අපට තේරුම් ගත හැකි කරුණකි. එනමුත්, මෙවන් ගර්හාත්මක යෙදුම් කොවිඩ්-19 ආසාදිත රෝගීන්ව හැඳින්වීමට යොදාගැනීමට එය සාධාරණ හේතුවක් වන්නේද? මෙවැනි හැඳින්වීම් ඔස්සේ සිදුවන්නේ කොවිඩ්-19 ආසාදිතයින් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇති වීම නොවේද? එසේ බලන විට මෙය වගකීම් සහගත, ආචාර ධාර්මික මාධ්‍යකරණයක්ද?

**#COVID19 #MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Dinamina**